**වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2015**

-----------------------------------------------------

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති ඉඩම තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය තුළ ලැබුණු රු.22,814 ක් වටිනා චෙක්පතක් ගිණුම්ගත කිරීමකින් තොරව බැංකුගත කර තිබුණි. එම චෙක්පත අගරු වී තිබුණු අතර එයද ගිණුම්ගත කර නොතිබුණි. බැංකුව විසින් අයකළ අගරු චෙක්පත් ගාස්තුවද ඇතුළත් රු.22,879 ක මුදල අදාල ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතනයෙහි බැංකු ගිණුම වෙත ඍජුවම තැන්පත් කර ඇති එකතුව රු.668,600 ක ශේෂයක් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව රු 468,100 ක් පාඨමාලා ගාස්තු, රු.55,000 ක් ලියාපදිංචි ගාස්තු හා රු.145,500 ක් විභාග ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වාගෙන යන පාඨමාලා 2 ක පාඨමාලා අධ්‍යක්ෂ ලෙස කොන්ත්‍රාත් පදනම මත එකම පුද්ගලයෙකු පත්කර තිබූ අතර පත්වීමේ ලිපිය අනුව එක් තනතුරක් සඳහා දිනකට පැය 04 ක් සේවය කළ යුතු වේ. ඒ අනුව තනතුරු දෙකෙහි රාජකාරී ආවරණයට පැය 08 ක් සේවයේ යෙදිය යුතු වුවත් සේවයකළ බව තහවුරු කිරීමට පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබීම හේතුවෙන් ගිණුම් වර්ෂය තුළ ගෙවා තිබූ රු. 570,000 ක් වූ දීමනා තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ආ) 2012 වර්ෂයේ සිට රු. 523,345 ක තොග අත්තිකාරම් ගැලපුම් ලෙස වෙළඳ හා වෙනත් ලැබිය යුතු යටතේ වූ ශේෂය සත්‍යාපනය කරගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවලට අනුව ගිණුම් වර්ෂය අවසාන දිනට දේපළ පිරියත හා උපකරණවල ශේෂය, ස්ථාවර වත්කම් ලේඛනය සමඟ සැසඳීමේදී රු. 78,285,350 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම පරිදි අදාල වගකීම් කාලය තුළ ඉදිකිරීම් දෝෂ පවතී නම් ඒවාට අදාල අඩු කිරීම් සිදුකර, නිම කරන ලද කොන්ත්‍රාත්වලින් දෝෂ වගකීම් කාලය අවසානයේ අදාල කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදිය යුතු වුවත් ඉදිකිරීම් දෝෂ පිළිබඳ කිසිදු ඇගයීමක් සිදු නොකර වසර 2 සිට 6 දක්වා එකතුව රු.323,700 ක රඳවා ගැනීමේ මුදල් නිරවුල් නොකර රඳවාගෙන තිබුණි.

(ආ) වසර 08 කට වැඩි කාලයක සිට පැවත එන රු.43,479 ක් වූ ලැබිය යුතු බැංකු පොලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව 2014 මැයි 02 සිට උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම මත පුද්ගලයකු බඳවාගෙන 2014 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.326,400 ක් හා රු .416,600 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) අධ්‍යයන කමිටුව මඟින් ගන්නා ලද තීරණ නැවත සලකා බැලීම සඳහා අධ්‍යයන කටයුතු පිළිගැනීම් හා විභාග පිළිබඳ ස්ථාවර කමිටුව (Academic, Affairs, Accreditation, Examinations & Discipline) නමින් කමිටුවක් ස්ථාපිත කර සෑම මාසයකට වරක්ම රැස්වීමක් පවත්වා විධිමත් අනුමැතියකින් තොරව කමිටු සාමාජිකයෙකුට රු.2000 බැගින් සමාලෝචිත වර්ෂය තුළ රු.126,000 ක දීමනා ගෙවා තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 | (I) අත්තිකාරමක් ලබාදීම හුදෙක් මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් සීමා වියයුතු වුවත් මාණ්ඩලික නොවන නිලධාරීන් 32 දෙනෙකු වෙත අවස්ථා 716 ක දී එකතු වටිනාකම රු.13,601,387 ක අත්තිකාරම් ලබාදී තිබුණි.<br>(II) අදාල කාර්යය නිම වූ වහාම ලබාගත් අත්තිකාරම පියවිය යුතු වුවත් අවස්ථා 4ක දී ලබාගෙන තිබූ එකතු වටිනාකම රු. 93,850 ක අත්තිකාරම් පියවීම දින 37 සිට දින 187 දක්වා කාලයක් ප්‍රමාදකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන්කළ යුතු වුවත් අධ්‍යයන නිලධාරීන් 7 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කර ගත නොහැකි වීම හේතුවෙන් රු.12,845,878 ක වැටුප් හා දීමනාවල නිවැරදිතාවය පරීක්ෂා කළ නොහැකි විය. |
| (ඇ) | 2015 ජනවාරි 22 දිනැති අංක 01/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛය | බාහිර කථිකාචාර්යවරුන් සඳහා ගමන් වියදම් හා ඉන්ධන දීමනා ගෙවා තිබියදී නිසි අනුමැතියකින් තොරව සංයුක්ත දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වරකට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් අගය රු.100,000 ක් වුවත් එයට පටහැනිව රු.105,600 සිට රු.464,954 දක්වා පරාසයක් තුළ අවස්ථා 22 කදී එකතු වටිනාකම රු. 3,540,134 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.8.1 වගන්තිය | ලංසු ඇගයීමට පත්කරන තාක්ෂණික ඇගයීම් කමිටු තුළ අදාල විෂය සම්බන්ධ විශේෂඥයෙකු ඇතුළත්විය යුතු වුවත් ආයතනය විසින් ඒ අනුව කටයුතු නොකළ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු .19,042,290 ක අතිරික්තයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.5,945,485 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.24,987,775 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආයතනයේ මෙහෙයුම් වියදම් රු .42,057,645 කින් වැඩි වී තිබුණද පුනරාවර්තන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන හා වෙනත් ආදායම් රු .64,747,740 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය කිරීමේදී 2011 හා 2014 වර්ෂ වලදී මූල්‍ය ප්‍රතිඵලයන්හි ඌණතාවයක් පෙන්නුම් කළ නමුත් අනෙකුත් වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක් ලබා තිබුණි. සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු සහ ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය ගැලපීමෙන් පසු ආයතනයේ දායකත්වය 2011 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අඛණ්ඩව වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. 2014 හා 2015 වර්ෂවලදී ආයතනයේ දායකත්වය පිළිවෙලින් රු.111,439,585 ක් හා රු.163,669,190 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දායකත්වය සියයට 47 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම් වර්ෂය තුළ යන්ත්‍ර හා උපකරණ සේවා කිරීම වෙනුවෙන් ආයතන 06 ක් වෙත රු. 655,105 ක් ගෙවා තිබූ නමුත් අදාල සේවාවන් ඉටුකරවාගෙන නොතිබුණි.

(ආ) වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පිහිටුවා ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් හෙක්ටයාර් 0.2074 ක් වූ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගමක් වෙත රු.26,250 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා එම කාර්යය ඉටුකරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පිරිවැය රු.159,925,550 ක්වූ ගොඩනැගිල්ලක ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබූ නමුත් ඉදිකිරීම් සැලැස්ම කොළඹ මහ නගර සභාවෙන් අනුමත කරවාගෙන නොතිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් 2014 වර්ෂය තුළ සිසුන් 73 දෙනෙකුට හා 2015 වර්ෂය තුළ සිසුන් 39 දෙනෙකුට රු. 3,000 ක් වූ ලියාපදිංචි ගාස්තු ගෙවීමකින් තොරව පාඨමාලාවලට සහභාගී වීමට අවස්ථාව ලබාදී තිබූ අතර ගිණුම් වර්ෂය අවසන් දින දක්වා ඔවුන්ගෙන් අයවිය යුතුව තිබූ රු. 336,000 ක් වූ හිඟ ලියාපදිංචි ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ආ) වැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකොට අත්තිකාරම් ලබාදීම හේතුවෙන් රු.364,080 ක වියදමක් සඳහා රු. 941,800 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ඇ) උපායශිලී සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම අනුව ආයතනයෙහි කටයුතු සිදුවන බව තහවුරු කෙරෙන ප්‍රගතිය දැක්වෙන වාර්තා පිළියෙල කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පර්යේෂණ කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේදී ලද රු. 3,913,400 ක ප්‍රදානයක් ගිණුම් වර්ෂය අවසාන දින දක්වා උපයෝජනය කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

----------------------------------------

ප්‍රධාන ගොඩනැගිල්ලෙහි පළමු මහලේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියාව සඳහා ලංසු කැඳවීමේදී අවම මිල ගණන් ලෙස රු.2,441,970 ක් ලබාදී තිබූ ලංසුකරු වෙනුවට රු.2,969,790 ක දෙවන මිල ලබාදී තිබූ ලංසුකරු තෝරාගෙන තිබීම හේතුවෙන් ආයතනයට රු. 527,820 ක පාඩුවක් සිදු වී තිබුණි. අවම මිල ඉදිරිපත් කළ ආයතනයට පෙර පලපුරුද්දක් නොමැති වීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුව ලෙස දක්වා තිබුණද ඊට මාස 04 කට පසුව එම ආයතනය වෙත රු.11,961,740 ක් වටිනා වෙනත් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.

## 4.5 හඳුනාගන්නා ලද පාඩු

------------------------

2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාර්යය පැවරුම් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයන් 12 දෙනෙකු වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල්

නොගෙවීම හේතුවෙන් ඉහත කාලයට අදාල සේවකයන්ගෙන් අයකර ගතයුතු දායකත්වය රු. 793,778 ක් හා අධිභාර රු. 1,073,707 ක් ලෙස එකතුව රු 1,867,485 ක් ආයතනයේ අරමුදලින් ගෙවා තිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | (i) දේපල අයිතිය තහවුරු කර නොගැනීම, නඩත්තු කිරීම හා අපහරණය පිළිබඳ දුර්වලතා පැවතීම. |
| | (ii) ඉන්වෙන්ට්‍රි භාණ්ඩවලට අදාළ ලේඛන යාවත්කාලීන නොකිරීම සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමඟ නොසැසඳීම. |
| (ආ) මූල්‍ය පාලනය | අත්තිකාරම් සීමාවන්ට අනුකූලව කටයුතු නොකිරීම හා නියමිත කාලයට නිරවුල් නොකිරීම. |